


# ගම්කාරයන්ගේ අයිතිය



නොබෝදා ඕස්ට්‍රේලියානු ජනතාව ඉදිරියට ගෙනෙනු ලැබූ වැදගත් ජාතික ප්‍රශ්නයක් වූයේ ආදිවාසීන්ගේ අයිතිය පිළිබඳ වගන්තියක් ව්‍යවස්ථාවට ඇතුළු කළ යුතු බවට ය. ඒ ගැන විවිධ මත දැරුවන් සිටියත් නිරාකරණය කරගත නොහැකි තරම් මත භේද ඇතැයි සිතිය නොහැකි ය.

එසේ තිබියදී ඕස්ට්‍රේලියානු දිනය වෙනුවෙන් ජනවාරි 26 වැනි දා කැන්බරා පාර්ලිමේන්තුව අබියස පැවැත්වුණ සම්මාන පිරිනැමීමක් අවුල් කරමින් පැන නැගුණු අනවශ්‍ය විරෝධතා ප්‍රදර්ශනය නිසා ජනතා අවධානය අද යොමුව ඇත්තේ අගමැතිනියට චෝදනා කරන විපක්ෂ නායක ටෝනි ඇබට් කරන පැමිණිල්ල කෙරෙහි ය. අගමැතිනියගේ නිලධාරියකු විසින් දෙන ලද ඔත්තුවක් නිසා ටෝනි ඇබට් ඒ අවස්ථාවේ සිටි තැන දැනගත් ආදිවාසී ක්‍රියාකරුවන් පිරිසක් ඔහු වට කරන්නට තැත් කිරීමය විවාදයට තුඩු දී ඇත්තේ. ඔවුන් එසේ කළේ ඔහුට පහර දීමට යයි සිතිය නොහැකි ය. මේ රටේ එහෙම දේශපාලකයන්ට පහර දීම සිදු නොවන නිසා ය. එපමණක් නොවේ. එතැන සිදුවූ කලබැගෑනිය අස්සේ අගමැතිනියත් ආරක්ෂා කර ගෙන ඉවතට රැගෙන යාමට නිලධාරීන්ට සිදු වූ බව පෙනිණි.

පහර දීමට ගියත් නොගියත් එතැන දක්නට ලැබුණු අශෝභන ජවනිකාව අප සාමාන්‍යයෙන් කියන ඕස්ට්‍රේලියානු ක්‍රමයට නොහොත් පිළිවෙතට කිසි සේත් ඔබින්නේ නැත. අගමැතිනියගේ සපත්තුවක් අහුලා ගත් කෙනකු එය වෙන්දේසි කිරීමට ගියේ නම් එයත් ඒ තරම් ලස්සන වැඩක් නොවේ.

ටෝනි ඇබට් මුළ දී අගමැතිනිය ක්‍රියා කළ ආකාරය ගැන ප්‍රශංසා කළත් දැන් ඇයට පහර දීමට පොටක් අල්ලා ගෙන ඇත. ඒ සිද්ධියේ සාපරාධී කිසිවක් සිදු නොවූ බව ෆෙඩරල් පොලීසිය දැනටමත ප්‍රකාශ කොට ඇතත් විපක්ෂය එතැනින් අත් නොහරින බවත් නිසැක ය.

ටෝනි ඇබට් කළ ප්‍රකාශයක් වරදවා වටහා ගැනීම නිසා මේ තත්වය උදගත වූ බවක් ද කියැවෙයි. ඔහු කතා කොට ඇත්තේ වසර හතළිහකට උඩ දී කැන්බරා පාර්ලිමේන්තුව අබියස ඉදි කොට අදත් පවත්වාගෙන යන ආදිවාසී කූඩාරම් තානාපති කාර්යාලය ගැන ය. එය අරඹන අවදියේ නොවිසඳුන ප්‍රශ්න රාශියක් ආදිවාසීන්ට තිබුණු බව සැබෑ ය. සියල්ලම නොවිසඳුණත් සෑහෙන විදියේ ප්‍රගතියක එදා මෙදා තුර ලබා ඇති බවද කිව යුතු ය.

"දැන් ඔතැනින් ඔබ්බට යාමට කාලය ඇවිල්ලා" යයි ටෝනි ඇබට් ප්‍රකාශ කළ බව කියැවෙයි. ඒ ප්‍රකාශයට පිළිතුරු දීමට ආදිවාසී පිරිස උසිගැන්වීම සඳහා යට කී ඔත්තුව දුන් බවද සිතිය හැකි ය. ප්‍රකාශයකට ප්‍රතිචාරයක් දීමට ප්‍රකාශකයා සොයා ගෙන යාම අද වාගේ දවසක අවශ්‍ය නොවේ. ඒ සඳහා යොදා ගත හැකි මාධ්‍ය ඇත . ටෝනි ඇබට් සොයා ගෙන යාමේ යටි අදහසක් තිබෙන්නට බැරි නැතැයි සිතිය හැක්කේ ඒ නිසා ය.

උතුරුකරයේ ආදිවාසී ජනයා අතර මත්පැන් උවදුර ළමා අපචාර සහ සෞඛ්‍යමය පිරිහීම ආදී කරුණු ගණනාවක් නිසා නොපමාව පියවර ගැනීමේ අවශ්‍යතාව වටහා ගත් හොවාරඩ් රජය විසින් එහි කටයුතු වලට " මැදිහත්වීමේ" වැඩ පිළිවෙලක් දියත් කරනු ලැබීම එක් අතකින් ප්‍රශ්නයට කෙළින්ම මුහුණ දීමක් විය. එහෙත් ආදිවාසීන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයේ ක්‍රියා මාර්ගයකට එළැඹිම සමහර ආදිවාසීන් පමණක් නොව විද්වතුන් ද විරෝධතා පළ කළහ. එහෙත් වැඩ පිළිවෙල දිගට ගෙන ගියා පමණක නොව ඉන පසු ඇති වූ කම්කරු රජයත් එ පිළිවෙත වෙනස කළේ නැත . එමගින් සිතූ තරම් ඉක්මනට විසඳුම් නොලැබුණත් ප්‍රතිඵලදායක බව පෙනී ගිය නිසා එසේම දිගටම ගෙන යන බව පෙනෙයි.

1997 දී පැහැරගත් පරපුර පිළිබඳ වාරතාව පිළිගන්වනු ලැබුවේ එවක සිටි අගමැති ජෝන් හොවාර්ඩ් ටය. මෙලබර්න් සමමන්ත්‍රණ කෙන්ද්‍රයේ පැවති ඒ උත්සවයේ දී වාර්තාව බාර ගනිමින් ජෝන් හොවාර්ඩ් කළ කතාව ආදිවාසීන් කුපිත කරවනනක් විය. ඔහු එදා පළ කළ අදහස අනුවම ක්‍රියා කරමින් 2009 දී කෙවින් රඩ් සහ බ්‍රෙන්ඩන් නෙල්සන් එකී පරපුරට වූ අසාධාරණය ගැන ශෝකය ප්‍රකාශ කරද්දී එතැනට නොගොස් සිටීමටත් තීරණය කළේ ය. 2012 දී ආදිවාසීන් පිළිබඳ වගනතිය ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතු බව නිර්දේශ කළ වාරතාව පිළිගන්වන ලදදේ අගමැතිනි ජූලියා ගිලාඩ්ට ය. එය සතුටින් පිළිගත් ඇය එය ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාව ද අවධාරණය කරන්නී ය.

ඔය වාර්තා දෙකම අගමැති දෙපොළට පිළිගැන්වූයේ එකම පුද්ගලයා ය. ඔහු ආදිවාසීන්ගේ පමණක නොව සෙසු ඕස්ට්‍රේලියානුවන්ගේත් ගෞරවයට පාත්‍ර වූ ආදිවාසී නායකයකු වන මහාචාර්ය පැට් ඩොඩ්සන් ය. දෙවැනි වතාවේ 2012 වාර්තාව පිළිගන්වමින් ඔහු කළ ප්‍රකාශයේ වැදගත් කරුණු දෙකක් සඳහන් විය. එකක මේ නිර්දේශ කරනු ලබන කාර්යය එනම් ආදිවාසී අයිතිය ව්‍යවසථාගත කිරීම කැනඩාව නවසීලන්තය හා නෝර්වේ බඳු රටවල් ගණනාවක් දැනටමත් ඉටු කර ඇති බව ය.

ඔහු සඳහන කළ දෙවැනි කරුණ ඊටත් වඩා වැදගත් යයි සිතමි. ඒ මුළු ලොවම අප දිහා බලා ඉන්නා බව ය. ඕස්ට්‍රේලියාව දියුණු වූ අපරදිග රටවල් අතුරින් එකක් පමණක් නොවේ. අනෙක් රටවල ප්‍රජාතන්ත්‍රවාදය මානව අයිතිවාසිකම් ආදී විවිධ ප්‍රශ්න පිළිබඳව උනන්දුවක් දක්වන සමහරවිට ඒවා විසඳීමට මැදිහත්වන රටකි. ඕස්ට්‍රේලියානු සෙබළුන් ඉරාකයටත් ඇෆඝනිසථානයටත යවා ඇත්තේ ඒ නිසා ය. එහෙවු ජනතාව ඉදිරියේ ඇති බොහෝ ප්‍රශ්න සහ ඕවාට යොදන ප්‍රතිකර්මත් දේශපාලකයනගේ පටු අරමුණු හේතු කොට ගෙන අවුල් වන්නේ ය. විටක මුල ප්‍රශ්නය යටපත් කරගෙන අතුරු ප්‍රශ්න හා ජවනිකා ඉසමතු වන්නේ ය.

එකේ සිය රටේ මිනිස් කොටසකගේ අයිතිවාසිකම් ගැන අර්ථවත් ආකාරයට ක්‍රියා කිරීම අනිවාර්යයනේම විය යුත්තකි. ප්‍රශ්නය වෙත යොමු විය යුත්තේ අන්න ඒ පසුබිම සිත්හි දරාගෙන ය.

ආදිවාසීන්ගේ ප්‍රශ්න ගැන ක්‍රියා කිරීමටත් රජයට උපදෙස් දීමටත් ආදිවාසීන්ගේ හා දූපත් වාසීන්ගේ කොමිසම නමින් සංවිධානයක් කම්කරු රජය විසින් කලකට උඩ දී පිහිටුවන ලදී. එය සාර්ථක ආකාරයට ක්‍රියාත්මක නොවූ බවත් මුදල් නාස්තියක් බවත් කියමින් හොවාර්ඩ් රජය විසින් අවලංගු කරන ලදී. මුදල් නාස්තියත් අයථා ක්‍රියාත් පිළිබඳ චෝදනා බොහෝ දුරට සැබෑ වනනටත් ඇත . එහෙත් ඒ සංවිධානය අවලංගු කිරීමෙන් පසුව සැබෑ ආදිවාසී නියෝජිතයන් සහිත කිසිදු යාන්ත්‍රණයක් නොතිබීමද මේ ප්‍රශ්නය යටපත්ව යාමට හේතුවකැයි සිතමි.

පැට් ඩොඩ්සන් මික් ඩොඩ්සන් ලුවිජා ඕඩොනගු ආදී ආදිවාසී නායකයන් කිහිප දෙනකු සිටියත් ඔවුන් සියළු දෙනාම ඒකමතිකව ක්‍රියා කරන පාටක් ද නැත. වඩා ප්‍රගතිශීලී අදහස් දරන්නකු ලෙසින් පෙනී යන නොයෙල් පියර්සන් පවා සමස්ත ආදිවාසී ජනතාව වෙනුවෙන් ඉදිරිපත්වීමට ශක්තියක් ඇතතෙක් නොවේ. සියල්ලන්ගේම එකගතාව කෙසේ වෙතත් සියල්ලන්ගේම අදහස් ගොණු කොට ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙලක් අවශ්‍යම වනුයේ යට කී ලෝකයා බලා සිටින බැල්මට අසුවනු පිණිස ය. ඒ බැල්මට හසු විය යුත්තේ තවමත් නිවාස පහසුව අධ්‍යාපනය සෞඛ්‍යය රැකියා පහසුකම් යන හැම අංශයකින්ම දිළිඳුබවක් පළ කරන ජන කොටසක් ලෙසින් නොව සැබෑ ප්‍රගතියක් ලබන ප්‍රෞඩ ඕස්ට්‍රේලියානුවන් හැටියට ය.

ඒ හිතකර තත්වය උදා කරලීම පිණිස සමස්ත ඕස්ට්‍රේලියානු ජනතාවම උනන්දු විය යුතු ය.

From Page 12

uttered in admonishing the Licchavi rulers. Licchavis were ruling a Republic which was noted for its good governance. Buddha's advice was simple and precise.

"Meet in peace, discuss in peace, and disperse in peace"

This meant meeting and discussing with mutual understanding and respect. Mahinda Rajapakse also added that for such discussions to succeed, the parties involved must respect each others' views and positions. It is not helpful to adopt the 'Holier than thou' attitude that is usually taken by the Big powers when dealing with smaller nations.

Burning of the Quran is simply an illustration of this unhealthy attitude prevalent among most of the peddlers of democracy going round delivering innocent masses from their autocratic rulers so that they too can become followers of Western democracies and their leaders.

Not only the petty soldiers who did the silly act of burning the Quran, but also their leaders have to accept one basic truth, which is that there are people who wish tom stand on their own feet, not depending on arrogant and uncaring helpers and protectors.

It is high time that someone points out to these missionaries that they ought to bring about the necessary changes in their thinking and attitudes before embarking on these missions of democratic reform.

